ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 මැයි 06 සඳුදා
05 වෙළුම - 26 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

LP - QD / 52/ News/ 2013



# ළමා ප්‍රදීපය



## දිරියෙන් සා. පෙළ ජයගත් කිතුනු දියණිය
## කළුතර කටුකුරුන්ද 'මාක් ශ්‍රී ආයතනයේ'
## දුලාංජලී ආරියතිලක

ලමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# මේ දිරිය දියණියගෙන් අපි ඉගෙන ගනිමු.

**ආදරණීය දුවේ පුතේ...**

අද ළමා ප්‍රදීපය කවරයේ කථාව සරසන්නේ දුලාංජලී ආරියතිලක කියන දුවගේ ලස්සන ඡායාරූපයකින්. දැන් සමහර විට ඔබ සමහරෙක් මේ දුලාංජලී කියන්නේ කව්ද කියලා දැනගෙන ඉන්නත් පුළුවන්, නොඉන්නත් පුළුවන්. අද මේ ළමා ප්‍රදීපයෙම තවත් තැනක ඈ ගැන විස්තරයක් පළ වෙනවා. ඒ වගේම පසු ගිය සති කිහිපය තුළ තවත් ජාතික පුවත්පත් කිහිපයකම ඈ ගැන විස්තර පළවී තිබුනා. එයට හේතුව වී තිබුනෙ අ.පො.ස.(සා.පෙ). ප්‍රතිඵලයි. ඇය විශිෂ්ට අන්දමින් මේ විභාගය සමත් වී තිබුනා. ආදර දුවේ, පුතේ මේ දුලාංජලී දුව විභාගය සමත් වීමේ ප්‍රවෘත්තිය තුළ තවත් දිග කථාන්දරයක් දිග හැරෙනවා. මේ දිරිය දියණිය මේ උසස් ප්‍රතිඵල ගන්න උත්තර ලිව්වේ අපි කවුරුත් වගේ අපිට හුරු අත් වලින් නොවෙයි. ඇය මේ ප්‍රතිඵල ගන්න උත්තර ලිව්වේ ඇගෙ පුංචි කකුලෙනුයි.

දැන් ඔබෙන් සමහරෙක් පුදුම වෙන්න පුළුවන්, කොහොමද, මොකද, ඇයි මේ දුවට එහෙම උත්තර ලියන්න සිදුවුනේ කියලා. ආදර දුවේ පුතේ මේ දුලාංජලී දුවගෙ කථාවත් එක්තරා අන්දමක කඳුළු කථාවක්. ඉපදෙන කොටම මේ පුංචි දෝණිට අත් දෙකම තිබුනෙ නැහැ. කකුල් දෙකත් එහෙම වලංගු භාවයකින් තිබුනෙ නැහැ. නමුත් කළුතර කළමුල්ලේ තිබෙනවා මාක් ශ්‍රී ආයතනය කියලා කතෝලික සභාවට අයිති ළමුන් බලා ගන්න ආයතනයක්. මෙහි නිර්මාතෘවරිය වන්නේ රීටා පෙරේරා කියන හරිම ධෛර්යවන්ත ගුරු මාතාවයි. ගරු ජුලියන් තිසේරා පියතුමන්ගේ අනුශාසකත්වය මත තමයි මේ ළමා නිවාසය මුල පටන්ම ගොඩ නැඟුනේ.

ඉතිං මේ පුංචි දෝණිව ඉතාමත් ආදරයෙන් රීටා පෙරේරා ගුරු මෑණියොත් , ගරු ජුලියන් තිසේරා පියතුමත් මුල පටන්ම රැක බලා ගත්තා. අත් දෙක නැහැයි කියලා පසුගාමී වෙන්නට දුලාංජලී දෝණිට ඉඩ හැරියෙ නැහැ. මේ පුංචි දෝණිත් හරි දක්ෂයි. ඈට මිහිරි කටහඬක් තිබෙනවා. ඈ ලස්සනට ගායනා කරනවා. සංගීතයට දක්ෂයි. ඈ පුංචි කකුලෙන් ඕගනය වාදනය කරනවා. කවුරුත් ඈට ආදරය කළා. ඒ හැමටත් පෙරළා ඈ ආදරය කළා.

ආදර දුවේ පුතේ, දේව අම්මාගේ මැදහත් කමත් ඈට නොඅඩුව ලැබෙනවා. ඈ දහමට හරිම ආදරෙයි. දහම තුළ ජීවත් වෙනවා. රීටා පෙරේරා ගුරු මාතාව ඈට සැබවින්ම අම්මා කෙනෙක් වුනා. මේ මාක් ශ්‍රී නිවාසයට ඇයව භාර ගත්ත දවසේ ඉඳලා දෝණි කටපුරාම අම්මා කියලා කථා කරන්නේ මේ රීටා ගුරු මාතාවටයි. නිවාසයේ ඉන්න හැම දරුවෙක්ම ඇයට සහෝදරයෙක්, සහෝදරියක්. කටුකුරුන්ද රෝමානු කතෝලික විදුහල ඇයට ඉගෙනීමට හොඳම තෝතැන්න වුනා. කටුකුරුන්ද රෝමානු කතෝලික විදුහලේ විදුහල්පති තුමා ගුරු මණ්ඩලය ඇයට ඉතාම ආදරයෙන් සලකා ඉගැන්වුවා. බලන්න ඈ පෙරලා තමන්ගේ පාසලට ලබා දුන් ත්‍යාගය. ඒ වගේම ලබා දුන් කීර්තිය කෙතරම් අගේද?

අත් දෙක නැහැයි කියලා කිසිම මොහොතක පසුබට වන්නෙ නැතිව ඇගේ සියළු තලෙන්තු වැඩි දියුණු කරගෙන දුලාංජලී දෝණි මෙතුවක් ආ මේ ගමන අපි හැම කෙනෙකුටම හොඳ අභියෝගයක් නේද? ආදර දුවේ, පුතේ, ක්‍රියා කරවිය හැකි එක් පුංචි පාදයකින් තමයි ඇය ඇගේ ජීවිත කථාන්දරය වෙනස් කරන්නෙ. පොත් පත් කියවමින්, ලෝකය ගැන දැන ගනිමින්, පරිඝණකය පුහුණු වෙමින් ඈ දෙවිඳුන්ට නැවත පිදූ ත්‍යාගය ඉතා ඉහලයි. තලෙන්තු වැඩි දියුණු කර ගත් මේ පුංචි දෝණි අද භාෂා කිහිපයක් කථා කරනවා. චතුර ලෙස ඈ ඉංග්‍රීසි භාෂාව කථා කරනවා. සිංහල භාෂාව මැනවින් ප්‍රගුණ කර තිබෙනවා.

ඒ පමණක් නොවෙයි, දුවේ පුතේ, ඈ අග්‍රගණ්‍යයේ ළමා නිළියක්. ඔයාලට මතකද ''සමනළ තටු'' චිත්‍රපටය. ඒ චිත්‍රපටයේ ප්‍රධාන චරිතය රඟ පාන ළමා නිළියත් අපේ දුලාංජලී දෝණිමයි. බලන්න කොච්චර ලස්සනට ඈ එම චිත්‍රපටයේ රඟපානවාද කියලා. සම්මාන කිහිපයක්ම ලබාගත් මේ දිරිය දියණිය සිනමාව , වේදිකාව, පුංචි තිරය අද ජය අරගෙනත් තිබෙනවා. අත් දෙකම නැතිව එක පාදයක වලංගු තාවයකුත් නැතිව තිබෙන අනික් පුංචි කකුලෙන් ජීවිතය ජය ගත්ත දුලාංජලී දෝණි පුංචි ඔබට කියන පාඩම නම් ඉතාම අනගි ජීවිත පාඩමක්. ජේසුට ඉමහත් ආදරයක් ලෙන්ගතු කමක් භය භක්තියක් පෙන්වන මේ අපේ පුංචි දෝණි ඒ සියල්ල ජයගන්නෙත් විශ්වාසය තුළ ජේසුගේ ආශිර්වාදයෙන්මයි. බලන්න ජීවිතය ජය ගන්න අවංකව උත්සහ කරන විශ්වාසයේ ජීවිත දෙවිඳුන් කෙතරම් බලවත් කරනවාද කියලා.

ඉතිං ආදර දුවේ , පුතේ, මේ දුලාංජලී දෝණිට ඔබත් ආදරය කරන්න. ඇයත් ඔබ හැම කෙනෙකුටම ආදරෙයි. ඔබත් දිරිය දියණියක් , පුතෙක් වන්නට ඉටා ගන්න. ජීවිතය ජය ගන්න. ජීවිත තලෙන්තු වැඩි දියුණු කර ගන්න. ජීවිතයට ආදරය කරන්න. ජීවිතය දුන් දෙවිඳුන්ට ආදරය කරන්න. ඔබට ගුරු හරුකම් උදව් උපකාර කරන වැඩිහිටියන්ට පෙරළා ගරු කරන්න. ආදරය කරන්න.

දුලාංජලී ආරියතිලක පුංචි දෝණි ඔබටත් පවසන්නේ මේ ජීවිත කථාවයි. ඇයට සුබ පතා ඔබත් ලියනවානම් ඇගේ ලිපිනය

දුලාංජලී ආරියතිලක , මාක් ශ්‍රී සරණ ආයතනය
කලමුල්ල - කළුතර

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා



# ආදර දේව අම්මා

සැබවින්ම දේව වචනය පිළිග නිමින් යහපත් වූද , නිහතමානී බැගෑපත් විශ්වාස වන්ත ජීවිතයක් ගත කරමින් ඇය ජීවත් වූවාය. ඒ නිසාම ඇය ජේසුස් වහන්සේ නැමැති දේව පුත්‍රයා බිහිකිරීමට පවා විශේෂාකාර ආශිර්වාදයක් හා වාසනාවක් ලැබුවේ කුඩා අවධියේ සිටම ජීවිතයේ සෑම අවස්ථාවකදීම දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරීත්වයට ඉඩ දී දේව කැමැත්ත සතුටින් භාර ගන්නට තරම් ඇය තුළ තිබූ අභ්‍යන්තර පිරිසිදුකම නිසාවෙනි.

ලෞකික ආශාවන් පුහු සිරිත් විරිත් කිසිත් නොතැකූ ඇය පූර්ණ හිස්භාවයක් අත්දකිමින් තම ජීවිතය තුළින් දේව කැමැත්ත පරිදි ඒ නව රුව අඹන්නට ඉඩහැර නිශ්ශබ්දව සිටියාය.

දේව මෑණියන් වේදනාව නැමති කුරුසිය කරින් ගෙන තම පෙම්බර පුත්‍රයාගේ කුරුසය පාමුල නිරතුරුවම ලඟ සිටිමින් දෙවියන් වහන්සේගේ සැලැස්ම අනුව පරිත්‍යාග ශීලි කැපවීම ද බලාපොරොත්තුවක් ද එතුමියගේ සිත තුළ ජනිතව පිරී තිබිණි. දේව පුත්‍රයා කුරුස ගසේදී දේව මෑණියන් හට අප සෑම ඇගේම ආදර දරුවන් ලෙස භාර දුන් විට දී ඇය නිරහංකාරව භාර ගත්තීය.

කිසිවිටකත් ඇය දෙවියන් වහන්සේ හා විවාදයකට ගියේ ද නැත. සෑම සිදුවීමක්ම ඇය සිත්හි නිදන් කොට තබාගත්තාය

දේව මාතාවන් තුළ තිබූ ඒ අචල විශ්වාසයද, දරාගැනීමේ ශක්තියද, ඉවසීමද පරිත්‍යාගශීලි කැපවීමද, දායාව , කරුණාව , බැහැපත්කම, නිහතමානි කම වැනි වටිනා ගුණාංග අද තරුණ පරම්පරාවට ඇත්ත වශයෙන්ම ආදර්ශයකි. දේව අණට කීකරුවීම ඇය තුළින් දිස්වූ විශේෂ ගුණාංගයකි. එම ගුණාංග වර්ධනය කර ගැනීමට ආදර්ශයට ගැනීමට මේ මැයි මාසය තුළ සිටම සිතට ගත යුතුව ඇත.

එමෙන්ම අප බාහිර ලෝකය සමඟ උරින් උර ගැටෙමින් ජීවත් වීමට උත්සහ කරන මෙවන් අවධියකදී දේව මෑණියන් තුළ තිබූ වටිනා ගුණාංග අත්‍යවශ්‍යවම පවතී. ඇය අපට නිරන්තරයෙන්ම පෙර මග සලසන විශිෂ්ට ප්‍රතිමූර්තියකි.

ඒ නිසාවෙන් ඇයට ගරුකිරීමක් වශයෙන් දේව මාතාව වෙනුවෙන් පුංචි කොන්ත පන්තියක්වත් කීමට ඔබට හැකිද?

දේව මෑණියන් වෙනුවෙන් මේ මාසයේදී දිනකට විනාඩි පහක් හෝ දහයක්වත් වෙන්කර ගැනීමට උත්සහ කළ යුතුය. එමෙන්ම අප ජීවිතවලට එල්ල වන්නාවූ දුක වේදනාව, පරාජය , නින්ද, අපහාස චෝදනා බාධාවන් ජය ගැනීමට දේව අම්මාගෙ වටිනා වූ ඒ ගුණාංගයන් ඉල්ලමින් යාච්ඤා කරන්න.

දේව මෑණියන්ගේ මැදහත්කම ඉල්ලමින් එක කොන්ත පන්තියක්වත් කීමට ඉඩ ප්‍රස්තාව සකසා ගැනීමට මොහොතකටවත් අමතක නොකරන්න.

මෙම ලිපිය කියවා පත්තර පිටු මත සැඟවී යන්නට ඉඩ නොදී මේ මාසය සිට අර්ථවත්ව ක්‍රියාවේ යොදවන්නට අවශ්‍ය ආශිර්වාදය , මැදහත්කම ඉල්ලමින් දේව අම්මාට කොන්ත පන්තියක්වත් ඔප්පු කිරීමට උත්සහ ගනිමු.

**විශ්මා ප්‍රියංජලී** - (යටියන මීසම)



කුරුකුලාව සාන්ත ලාසරස් විදුහලෙහි සිංහල අලුත් අවුරුදු උත්සවය පසුගියදා එම ක්‍රීඩාංගනයේදී පැවැත්වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**එච්.ඒ. කල්දේරා**

# ගින්දරෙන් පරිස්සම් වෙමු.

කැතරින් දරුවන් තිදෙනෙකුගේ මවක්. ලොකු දුව නිලු වයස දහයක දැරියක්. දෙවැනි පුතා තිලක්ට වයස අවුරුදු සයක් වන අතර, තෙවැන්නා සුදත් වයස අවුරුදු පහක කුඩා දරුවෙක්.

පාසල් නිවාඩු කාලයේ දවසක කැතරින්ට නගරයට යාමට සිදුවුණා. මල්ලිලා දෙන්නාව පරිස්සමින් බලා ගන්නා ලෙස නිලුට බාර දී කැතරින් තම කාරයෙන් නගරයට ගියේ පැයකට අඩු කාලයක් ඇතුලත නැවත නිවසට පැමිණීමට සිතා ගෙනයි.

තිලක් සහ සුදත් සෙල්ලම් කාර් රැගෙන සාලයේ සෙල්ලම් කරන්නට පටන් ගත්තා. මල්ලිලා සෙල්ලම් කරන අතර, නිලු කතන්දර පොතක් කියවන්නට පටන් ගත්තා.

තරමක වේලාවකට පසු , ඇය මල්ලිලාට සහ තමාට බීම සඳහා තම මව විසින් සකසා ගිය දොඩම් යුෂ ගැනීමට කුස්සියට ගියා. මල්ලිලා දෙන්නාත් ඇය පසු පසින් ගොස් දොඩම් යුෂ බී නැවත සෙල්ලම් කිරිමට සූදානම් වුණා.

කුස්සියේ සිට ආපසු යන ගමන් , තිලක් කුස්සියේ ලිප අසල තිබූ ගිනි පෙට්ටිය සාලයට ගෙනාවා. '' මල්ලි අපට පුලුවනි ගිනිකූරු වලින් කාර් වලට යන්න පාරක් හදන්න.'' ඔහු බොහොම සතුටින් සුදත්ට කිවුවා.

ඔවුන් දෙදෙනා සියලු ගිනි කූරු පාවිච්චි කරමින් පාරවල් සදා ''බිරූම් - බිරූම්'' හඬින් තම තමන්ගේ කාර් පාරවල් දිගේ රැගෙන ගියා. හදිසියේම නිලුට මතක් වුනා ඇය මසන්නට පටන් ගත් ලේන්සුව. ''දැන් කියෙව්වා ඇති'' යි සිතූ ඇය තම මැහුම ගෙන ඒමට කාමරයට ගියා.

තම අක්කා කාමරයේ නැති බව තේරුම් ගත් තිලක් ගිනි කූරක් සහ ගිනි පෙට්ටිය අතට ගත්තා ''මල්ලි එන්න අපි අක්කා එන්න ඉස්සරවෙලා එක ගිනිකූරක් ගහල බලමු. ඔහු මල්ලිට කීවා.

සුදත් කුඩා නමුත් ගිනිකූරු ඇල්ලීම තහනම් දෙයක් බව දැන සිටියා. ඔහු බයෙන් බයෙන් තිලක් දෙස බැලුවා.

''අම්මා අපට කියල නේද තියෙන්නේ ගිනි කූරු අල්ලන්න එපා කියලා.'' ''ඒකට කමක් නැහැ. එකයි නේ පත්තු කරන්නේ.'' ඔහු මල්ලිට කියමින් තිලක් ගිනි කූරක් පත්තු කළා. ඉතාම කෙටි මොහොතක් දැල්වුණු දැල්ල දෙස තිලක් ආශාවෙන් බලා සිටියා. තිලක්ට තේරුණේ නැහැ ගිනි කූර  ඉක්මණින්ම පත්තු වී යන බව. ගිනිකූර අල්ලා සිටි ඇඟිලි වලට රස්නය දැනෙන විට ඔහු ගිනිකූර අතහැරියා. ගිනි කූර සාලයේ තිබූ බුමුතුරුණ මතට වැටුණා. නිමේෂයකින් බුමුතුරුණට ගිනි ඇවිලුනා.



ගිනි දැල්ලට බය වුණු ළමුන් දෙදෙනා ''අක්කා අක්කා'' කියමින් බෙරිහන් දෙන්නට පටන් ගත්තා. මසන්නට සැරසුණු ලේන්සුවත් අතැතිව නිලු සාලයට දුව ගෙන ආවා. ගිනි දලු දුටු සැනින් ඇය කුස්සියට දුව ගොස් කොස්ස ගෙන ගිනි දලු වලට ගසමින් ගින්න නිවන්න උත්සාහ කළා. නමුත් ගින්න ඉක්මණින්ම පැතිරෙන්නට පටන් ගත්තා. තමාට තනිව ගින්න නිවන්න බැරි බව තේරුම් ගත් සැනින් ඇය මල්ලිලා දෙන්නාගේ අත් අල්ලා ගෙන වහාම එලියට දිව්වා.

''ගින්දර .....ගින්දර'' ළමුන් තිදෙනා බෙරිහන් දෙන්න පටන් ගත්තා. ඔවුන්ගේ කෑගැසීමට එළියට ආ අසල්වැසියෙක් ගින්න දුටු වහාම ගිනි නිවන හමුදාවට දුරකථනයෙන් දැනුම් දුන්නා. ගිනි නිවන හමුදාවේ වාහනයක් ඉක්මණින් පැමිණියත් ඒ වන විට ගෙදර එකම ගිනි ජාලාවකින් වැසී ගොස්. කැතරින් නිවසට එන විට මහා කලු දුමක් නිවස දෙසින් පෙනුනා. වංගුවෙන් කාරය හැරවූ ඇය වහාම කාරය නතර කර තම නිවස දෙසට දිවුවා. ''අනේ මගේ ළමයි කෝ'' යි කියමින් ඇය විලාප දෙන්න පටන් ගත්තා. ගිනි නිවන හමුදාවේ භටයකු  පැමිණ ඇයට බිය නොවන ලෙසත් ,
දරුවන් තිදෙනා හානියකින් තොරව අසල් වැසි නිවසක ඉන්නා බවත් කීවා. ''බඩු මුට්ටු පිච්චිලා ගියාට ආපහු අර ගන්න පුලුව-න්. නමුත් දරුවන්ට අනතුරක් වුණා නම් මට ජීවත් වෙලා වැඩක් තියේද'' කියා හඬමින් දරුවන් සිටි නිවස බලා ඇය දුව ගියා.

දරුවන් සමග සෑහෙන වෙලාවක් ගත කළාට පසුව ටිකෙන් ටික ගින්න කෙසේ හට ගත්තාදැයි ඇයට වැටහී ගියා. ''අනේ මං පුතාලට කොච්චර කියලා තියෙනවාද ගිනි පෙට්ටිය නම් අල්ලන්න එපා කියලා දෙමාපියො කියන දේවල් අහනව නම් මෙහෙම නස්පැත්තියක් සිද්ධ වෙන්නේ නෑ නේද.'' කියමින් කැතරින් නැවත හඬන්නට පටන් ගත්තා.

තිලක්ට, සුදත්ට සහ නිලුට පමණක් නොව ඔවුන් සියලුම දෙනාගේ යාලුවන්ටත් මෙම ගින්න ජීවිතයට අමතක නොවන සිදුවීමක් වූවා.දරු තිදෙනා හැදී වැඩී වැඩිහිටියන් වන තුරුත්, ඊට පසුවත් හැකි සෑම අවස්ථාවකදීම දරුවන් දෙමාපියන්ට කීකරු විය යුත්තේ ඇයිදැයි යන්න අන් අයට තේරුම් කර දෙන්නට ඔවුන් වග බලා ගත්තා.

**✍ ෆ්‍රීඩා විල්ලවරායන් - කැනඩාව**

# අභියෝග ජයගත් දිරිය දියණිය



දුලංජලි ආරියතිලක, කලමුල්ල කනිෂ්ඨ විදුහලින් මූලික අධ්‍යාපනය ලබා පසුව කටුකුරුන්ද රෝ.ක. විදුහලට ඇතුළුවී අධ්‍යාපනය හැදෑරීය. ඇය පසුගිය වසරේ අ.පො.ස (සාමාන්‍ය) පෙළ විභාගයට තම පාදයෙන් පෑන් තුඩ හසුරුවමින් පිලිතුරු සපයා. A - 6 , B - 2 , C -1 ක්ද ලබා ගෙන උසස් අන්දමින් සමත් වී ඇත. ''මා කිසිම උපකාර පන්තියකට ගියේ නෑ''. පාසලේ ඉගැන්වූ විෂයයන් මා නැවත අධ්‍යයනය කරලා තමයි විභාගය සමත් වුනේ. මා හට ඉගෙනීමට සියළු පහසුකම් '' මාක් ශ්‍රී'' ආයතනය තුළ සපයා දී තිබෙනවා. එමෙන්ම , මා මේ තැනට ඒමට සෙත සැලසූ දෙවි පියාණන්ට මා තුති පුදනවා යයි ඇය ළමා ප්‍රදීපයට පැවසුවාය.

ගාල්ලේ උපත ලැබූ දුලාංජලි දැරිය ඉතා කුඩා කල සිට කටුකුරුන්ද ''මාක් ශ්‍රී ''සරණ සේවා ආයතනයෙනි හැදුන වැඩුන කෙනෙකි. අ.පො.ස උසස් පෙළ වානිජ අංශයෙන් කිරීම ඇයගේ බලාපොරොත්තුවයි. දැනට මාස හයක ග්‍රැෆික් ඩිසයිනින් පාඨමාලාවක්ද හදරන ඇය, ඉදිරි අනාගතයේදී ග්‍රැෆික් ඩිසයිනර් කෙනෙකු වීමටද අපේක්ෂාවෙන් සිටින්නීය.

සංගීත විශාරද , එඩ්වඩ් ජයකොඩි මහතාගෙන් අවුරුදු හතරක් සංගීතය හැදෑරූ ඇය, කළුතර ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ 2003 ශිෂ්‍ය නායිකා සංගමය මගින් ඉදිරිපත් කරන ලද ''රළ තරණය'' කෙටි චිත්‍රපටයකද , වසර 2005 දී සෝමරත්න දිසානායක මහතාගේ ''සමනළ තටු'' චිත්‍රපටයේද ඇය රංගනයෙන් දයක වූවාය. ඇයව සෝමරත්න දිසානායක මහතාට හඳුන්වා දී ඇත්තේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මගේ ජීවිතයට ආලෝකයක් ලබා දෙන ''මාක් ශ්‍රී'' ආයතනයේ ගරු ජූලියන් තිසේරා පියතුමන්ට , රීටා පෙරේරා මහත්මිය ඇතුළු ''මාක් ශ්‍රී'' පවුලේ සියළු දෙනාට මා ස්තුති වන්ත වන අතර කටුකුරුන්ද රෝ.කතෝලික විදුහලේ විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලයට , මට උදව් කරන පාසලේ යහළු යෙහෙළියන් ඇතුළු සැම දෙනාට මා ලැබූ ජයග්‍රහණය ගැන ස්තුති වන්ත වෙනවා යැයි ඇය පැවසුවාය.

ඇයගේ නොපසුබට ධෛර්යය , ආදර්ශවත් දිවි මග තව තවත් ශක්තිමත් වේවායි ! ළමා ප්‍රදීපය සුබ පැතුම්

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

## කළුතර,කටුකුරුන්ද දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්

**කළුතර, කළමුල්ල මීසමේ කටුකුරුන්ද දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් කටුකුරුන්ද ශු. පිලිප්නේරි දෙව් මැඳුරේදී පැවැත්වුණි.**

දහම් පාසලේ 6 වන ශ්‍රේණියේ සිට ඉහල ළමුන් සඳහා පැවති මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මෙය මොහු මෙහෙය වූ 52 වන ළමා ලේඛක වැඩමුළුව විය. මෙයට සහභාගී වූ ළමුන්ට ජනසංනිවේදනය , පුවත් පත් කාලාව හා නිර්මාණ කරණය පිළිබඳව දැනුම්වත් කළ අතර වැඩමුළුව අවසානයේදී අභ්‍යාසයක්ද ලබා දුනි. මීසම් සේවක ගරු මොරිස් නාමල් පියතුමාගේ මඟ පෙන්වීම යටතේ මීසම් සහයක ගරු ප්‍රියනාල් අසන්ත පියතුමාගේ සහයෝගයෙන් කටුකුරුන්ද දහම් පාසල් ප්‍රධානි රේනුකා සිල්වා මහත්මිය මෙය සංවිධානය කරනු ලැබීය.

**ආර්. නෝනිස්**



**සේයා : ටෝනි නිශාන්ත - මහවැව**

**මාසික සිතිවිල්ල**

**මාසික**
**සිතිවිල්ල**
“අප්‍රේල් මාසය”
ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය
මාවත,
කොළඹ 08.

**ජයග්‍රාහි නිර්මාණ ලබන සතියේ**

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව ඇසුරෙන් පළවූ ප්‍රශ්න වලට පිළිතුරු

## ප්‍රශ්න අංක 56 සිට 65 දක්වා පිළිතුරු

56. i) එතෙරවීම

ii) ★ ගඩොල් කර්මාන්තය ★ කුඹල් කර්මාන්තය
★ කෙත් වල විවිධ කෘෂිකර්මාන්තය

iii) ★ රතු මුහුද තරණය ★ කාන්තාරයේදී ජලය ලැබීම
★ ගිනි ටැඹ හා වළා ටැඹ මගින් මග පෙන්වීම
★ ආහාර වශයෙන් මන්නා සහ වටුමස් ලැබීම
★ සීනායි ගිවිසුම හෙවත් දස පනත ලැබීම

57. i) දෙවියන් වහන්සේ වෙනුවෙන් ජනතාවට කතා කරන්නෙකි
ii) යෙසායා , ජෙරමියා , එසකියෙල්

iii) ★ දර්ශනය හා විශේෂ අත් දැකීම
★ කැඳවීම භාර දීම ★ දිවැසිවරයාගේ අකමැත්ත
★ ධෛර්යවත් කිරීම ★ යවනු ලැබීම

iv) ★ දෙවි සමිඳාණන් පිළිබඳ වඩාත් ගැඹුරු අවබෝධයක් ලබාදීම
★ ගිවිසුම් ජීවිතයට ඊශ්‍රායෙල් ජනතාව නැවත සමීප කරවීම
★ මානව සමානාත්මතාවය සහ සාධාරණත්වය ක්‍රියාත්මක කරවීම
★ ගැළවුම් කරුවාණන් හෙවත් මෙසියස් වහන්සේගේ පැමිණීම ප්‍රකාශ කිරීම
★ ගැළවුම්කරුවාණන් හෙවත් මෙසියස් වහන්සේ සඳහා මාර්ග යක් සූදානම් කිරීම

v) ★ දෙවිඳුන් හඳුනන්නේ නැති පුද්ගලයන්ට උන්වහන්සේව හඳුන්වා දීම
★ දෙවිඳුන් අවිශ්වාස කරන ජනයාට ඒ පිළිබඳ අවබෝධය ලබා දීම
★ පාසලේ දී යහළු යෙහෙළියන්ට දෙවියන් වහන්සේ පිළිබඳව කියාදීම
★ සමාජය තුළදී නිතරම සත්‍යයට සාක්ෂි දැරීම
★ යහපත්ව දිවිගෙවීමෙන් සමාජයට සැබෑ දිවැසි වරයකු වීම
vi) ★ ප්‍රසාද ස්නාපනය මගින්

vii) ★ දෙවිඳුන් පිළිබඳ අන්අයට අවබෝධය ලබා දීම
★ සත්‍යයට සාක්ෂි දැරීම

★ පවිටු පුද්ගලයන් යහමගට ගැනීමට ක්‍රියා කිරීම

58. ★ ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට වැඩම කිරීම

59. ★ ස්නාවක ජොහාන් විසින් ජේසුස් වහන්සේව ජොර්දාන් නදියේදී බෞතිස්ම ස්නාපනය කළ අවස්ථාවේදී
★ ජේසුස් වහන්සේගේ අන්‍යරූප විලාශ වීමේ සිද්ධියේදී

60. ★ මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේය. (ජොහාන් 14/19 )
★ මම යහපත් බැටළු එඬේරා වෙමි. (ජොහාන් 10/14)
★ මාර්ගයද සත්‍යයද ජීවනයද මම වෙමි. (ජොහාන් 14/16)

61. ★ මෙහෙසුරු දිවැසිවර
★ සමිඳුන්ට පෙරටුව යමින් එතුමන් මග පිළියෙළ කරන බැවිනි.

62. ★ දේව පුත්‍රයාණන් මිනිසත් බව ගත්තේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ වරමින් මරියතුමියගේ කුසයෙහි ගැබ්බැස උපත ලබමින්ය.

63. ★ දේව පුත්‍රයාණෝ ශුද්ධාත්මානුභාවයෙන් මරියතුමියගේ කුසයෙහි පිළිසිඳීම , මාංශගත වීමයි.
★ අප සැම නාසරතයේ ජේසුස් වහන්සේ හා සමාන වන පිණිස ඔවුන් වහන්සේ අප හා සමාන මිනිස් බවගෙන මෙලොවට වැඩම කර අප අතර වාසය කිරීම

64. ★ උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වීම
★ පරමෝත්තමයාණන්ගේ පුත්‍රයා වීම
★ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමින් වහන්සේ උන් වහන්සේට දෙන බව
★ ජාකෝබ් වංශය කෙරෙහි සදහටම රජකම් කරන බව
★ උන්වහන්සේගේ රාජ්‍යයට කෙළවරක් නොමැති බව

65. ★ ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගතවීමේ අභිරහස
★ තුන්කාලයේ ආරාධනාව

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

# අම්මේ, වැඳලා පුදමි ඔබගේ ඔය දෙපා විරු

දයාබර නංගියේ , මල්ලියේ , ලොවෙහි උපන් සැම පුද්ගලයකුටම අම්මා කෙනෙක් සිටියි. අන්ධකාර වූ මේ විෂම ලෝකය තුළ මා තනි වූ විට මා සවිමත් කළේ ඔබයි මගේ අම්මේ. කියා බොහෝ පුද්ගලයන් පවසා ඇත. මවකගේ සිතෙහි දරුවන් වෙනුවෙන් උපදින්නා වූ සෙනෙහස , කරුණාව , සුළු පටු නැත.

තම සිරුරෙහි දුවන රතු ලේ සුදු පැහැති කිරි බවට පත් වන්නේ ඒ දරුවන්ට තිබෙන ආදරය නිසාය. දරුවාගේ බුද්ධිය යහපත් අයුරින් වර්ධනයට අවශ්‍ය මුල් පියවර ලෙස නිවස තුළදී මැනවින් ඇය පියා සමග එකතු වී කටයුතු කරයි. පෙර පාසලේ සිට උසස් පෙළ දක්වාත් ඉන් එහාටත් අම්මාවරු දරුවන්ගේ ජීවිත ලස්සන කරනට දුක් මහන්සි වෙන අවස්ථා අප දැක ඇත.

දුවක් හෝ පුතෙක් හෝ වේවා තම දරුවා දෙමව්පියන්ට මිල කළ හැකි රන් වලට වඩා වැඩි සම්පතක් වේ. දයාබර නංගියේ මල්ලියේ, ඔබට පෙනෙන දෙවියන් වනුයේ ඔබේ දෙමව්පියන්ය. ඔවුන්ට ආදරය නොකර ඔබ කෙසේද නොපෙනෙන දෙවියන්ට ආදරය කරන්නේ.

මදක් සිතන්න ඔබ වෙනුවෙන් දහසක් දුක් විඳපු ඔබේ අම්මා වෙනුවෙන් ඔබ මොනවාද කර ඇත්තේකියා. ඇය ජීවත්ව සිටිනා කාලය තුළ ඇයව හොඳින් ආදරයෙන් රැක බලා ගන්න. ඇය මිය ගිය පසු කොතරම් දාන ධර්ම දුන්නත් පලක් නැත.

ඔබේ අම්මා බුලත් හපන, රෙද්දක් හැට්ටයක් අඳින, ඉංග්‍රිසි කථා කළ නොහැකි, හැන්දෙන් ගෑරුප්පුවෙන් ආහාර ගැනීමට නොදත්, අසරණ කාන්තාවක් වන්නට පුළුවන්. එහෙත් ඒ නිසා ඇයව පහත් කර දමා වෙනත් විලාසිතා ලෝකයේ මවකගේ පිළිසරණක් පතන්න එපා. අම්මාට ආදරය කරන ඔබට කිසි දින වරදින්නේ නැත. අතහරින්න එපා පුතේ , දාලා යන්න එපා ඔබේ අම්මාව.

ජනක මංජුශ්‍රී රාජපක්ෂ - මෝදර

## ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ බක්මහ අසිරිය



**රාගම , පේරලන්දේ ළදරු ජේසු පෙර පාසලේ පාලිකා නදීෂා ගුණතිලක මහත්මිය ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය පෙර පාසලේ සිඟිත්තන් අවුරුදු චාරිත්‍ර පිළිබඳව දැනුවත් කර චාරිත්‍ර ඉටු කිරීමෙන් පසු සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු මෙහි දිස්වෙයි.**

සී.ආර්. ඩික්සන් ඇන්ටනි



පමුණුගම ඇලෙන්එගොඩ ශාන්ත ජෝශප් පෙර පාසලේ ''සිඟිති බක්මහ උළෙල'' ඇලෙන්එගොඩ ශාන්ත සෙබස්තියන් දෙව්මැදුරු භූමියේදී පැවැත්විණි.

එහිදී අවුරුදු කුමරිය තරගයෙන් ජයග්‍රහණය කළ අවුරුදු කුමරියෝ අවුරුදු කුමරිය ෂෙමිරා දිනිති (මැද) දෙවැනි ස්ථානය නිසංසලා දේව්න්දි (වමේ) තෙවන ස්ථානය සචිනි නවෝද්‍යා (දකුණේ) වෙති. පෙර පාසලේ පාලිකා උදේනි රෝෂණි මහත්මියගේ මෙහෙයවීමෙන් අවුරුදු උළෙල සංවිධානය කෙරිණි.

**ඇන්ටන් ජයසූරිය**

**(පසුගිය සතිය සබැඳේ.....)**

**11. පාප්වහන්සේට නොවරදින සුළු භාවයක් ඇතැයි කියා කතෝලිකයන් පවසන්නේ ඇයි?**

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තම ශුද්ධවූ සභාව සීමොන් නොහොත් පේදුරු නම් වූ පර්වතය මත ස්ථාපිත කළ අවස්ථාවේදීම උන්වහන්සේ ඔහුට මෙසේ පැවසූ සේක, ''ස්වර්ග රාජ්‍යයේ යතුර ඔබට දෙන්නෙමි. ඔබ පොලොවෙහි දී යමක් බඳින්නෙහි ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේ ය. ඔබ පොලොවෙහි දී යමක් මුදන්නෙහි ද එය ස්වර්ග යෙහි දී මුදනු ලබන්නේ ය.'' (මතෙව් 16:18-19). මෙම වදන් ක්‍රිස්තුන් වහන්සේ පැවසුවේ පේදුරු තුමාට පමණි.

මේ අවස්ථාවේදී විශේෂිතවූ වගකීමක් ක්‍රිස්තුන් වහන්සේ පේදුරු තුමන්ට දුන්න බව අපට මනා ලෙස පෙනේ. මනුෂ්‍යයන් ස්වර්ගයට ගෙනයෑම සම්බන්ධයෙන් අසහාය වගකීමකුත් බලයකුත් මේ වචන වලින් පේදුරු තුමාට පැවරේ - ( එනම් ස්වර්ග රාජ්‍යයේ යතුරු ලැබීම සහ මෙලොව බඳින හෝ මුදන සියල්ල ස්වර්ගයේ අනුමත වීම). තවද, මේ වදන් තුළින් පේදුරු තුමන්ගේ ආත්මික පාලන බලය වඩාත් තහවුරු වන අතර, එය ක්‍රියාත්මක වීමේදී එතුමාට වරදින්නට දෙවියන් වහන්සේ ඉඩ නොදෙන බවත්, තම ලෝකෝත්තර කාර්ය සම්බන්ධයෙන් නොවරදිනසුළු භාවය ලැබෙන බවත් මනාලෙස තහවුරු වේ.

මීට අමතරව , ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පෙදුරු තුමන්ට පමණක් පැවසූ තවත් වදන් අප සිහිපත් කළ යුතුය. ''සීමොන් සීමොන්,...... ඔබේ සහෝදරයන් ධෛර්යවත් කරන්නැ'' (ලූක් 22:31-32) සහ ජොහාන්ගේ පුත්‍ර වූ සීමොන් .... මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්නැ...... මාගේ බැටළුවන්ගේ එඬේරා වන්නැ .... මාගේ බැටළුවන් පෝෂණය කරන්නැ'' (ජොහාන් 21:15-17). මේ වදන් තුළින් ද අපට පෙනෙන්නේ, ක්‍රිස්තුන් වහන්සේ විසින් පේදුරු තුමන්ට තමන් වහන්සේගේ ශ්‍රාවකයන් අතර වගකීම සහිත මූලික තැනක් දෙන ලද බව ය. තවද උත්ථාන වූ කිතු සමිඳුන් තමන් නැවත ස්වර්ගයට යෑමට පෙර තම ශුභාරංචිය ලොව පුරා ප්‍රකාශ කිරීමේ කාර්යභාරය පැවරුවේ පේදුරු තුමන් ප්‍රමුඛ තම ශ්‍රාවකයන්ට ය. (මතෙව් 28:18-20 / මාක් 16:15 / ලූක් 24:47-49 / ජොහාන් 20:21 / ක්‍රියා 1:8 බලන්න) සත්‍ය මාර්ගය ඔස්සේ දේව ජනතාව හසුරුවනු ලබනු සඳහා ශුද්ධෝත්තම බලයෙන් තම ශ්‍රාවකයන් ශක්තිමත් කිරීමට ද ක්‍රිස්තුන් වහන්සේ පොරොන්දු වූ සේක. ( ජොහාන් 16:12-15).

පේදුරු තුමන් වෙත පවරන ලද වගකීම් සහ එතුමන්ට දෙන ලද විශේෂ වරම් ක්‍රිස්තුන් වහන්සේ විසින් දෙන ලද්දේ දේව ජනතාවගේ යහපත පිණිස ය. එම වරම් පේදුරු තුමන්ගේ ජීවිත කාලයට පමණක් සීමා කළ නොහැකි ය. ක්‍රිස්තුන් වහන්සේගේ දූතකාර්ය අඛණ්ඩව කරගෙන යෑම පිණිස. අපෝස්තුළුවරුන්ගේ තනතුරට අන් අය කලින් කලට පත්වූවා සේම, පේදුරු තුමන්ගේ සසුන් නායක තනතුරට ද අන් අය පත් විය යුතු අතර, එම නායකත්වය අද දරන පාප්වහන්සේට ද පේදුරු තුමා ලැබූ විශේෂ වරම් ලැබිය යුතුය.

ශුද්ධවූ සභාවේ නායක එඬේරාණන් සහ ගුරුවරයා වශයෙන් ශුද්ධාසනයේ (එනම් පේදුරු තුමාගේ නිල ආසනයේ) සිට විශ්වාසය හා සදචාරය පිළිබඳ සත්‍යතාවයන් ලොවට ප්‍රකාශ කරත්දී දෙවිඳුන් විසින් පාප්වහන්සේ නොවරදින සුළු භාවයෙන් රක්ෂා කෙරේ.

නව ගිවිසුමේ අඩංගු ග්‍රන්ථ 27 ශුද්ධාත්මානුභාවයෙන් ලියැවූ නිර්වද්‍ය දේව වචනය ලෙස ලොවට ප්‍රකාශ කළේ පාප්වහන්සේ ප්‍රමුඛ ශුද්ධවූ සභාවයි. එසේ කළ හැකි වූයේ, එදා පේදුරු තුමන්ට දනය කරන ලද විශේෂ වරම් එතුමන්ගේ නායකත්වයට පත්වන පාප්වහන්සේට ද ක්‍රිස්තුන් වහන්සේ දනය කරන බැවිනි.

ඇඳහිල්ල සම්බන්ධ සියල්ල නිර්වද්‍ය යි පැවසිය හැක්කේ නොවරදින සුළු භාවයක් ඇති පුද්ගලයෙකුට පමණි. එබැවින් පාප්වහන්සේගේ නොවරදින සුළු භාවය පිළිනොගන්නේ නම්, නව ගිවිසුමෙහි අඩංගු ග්‍රන්ථ 27 නිර්වද්‍ය යි පිළිගත හැක්කේ කෙසේද?

# කතෝලික සභාවේ විශිෂ්ටත්වය

**12. එක්සත්කම මුලදී කිතුනු සභාවේ ලක්‍ෂණයක් වී තිබුණේද?**

එක්සත්කම මුල් කිතුනු සභාවේ ලක්‍ෂණයක් වූ බව ශුද්ධ වූ බයිබලයෙන්ම සනාථ වේ.

**උදාහරණ :-**

i. **"එකල ඇදහිලිවතුන් සමූහයා එක්සත් ව, එක්සිත් ව සිටිය හ" (ක්‍රියා 4:32)**

ii. පාවුලු තුමා මෙසේ පවසයි:-

**"බොහෝ දෙනෙක් වූ අපිත් ක්‍රිස්තුන් වහන්සේ හා සම්බන්ධ ව එක ශරීරයක් වී, එහි වෙන් වෙන් වශයෙන් අන්‍යෝන්‍ය අවයවයෝ වම්හ" (රෝම 12:5)**

**"..... ඇත්තේ එකම ශරීරයත්, එක ම ආත්මයාණන් වහන්සේත්ය, එක ම සමිඳාණන් වහන්සේත්, එක ම ඇදහිල්ලත් , එක ම බව්තීස්ම - ස්නාපනයත් ය." (එපීස 4:4-5)**

**13. භේද - භින්නවූ දහමක් උගන්වන අයගෙන් මුල් කිතුනුවන් ආරක්‍ෂා කිරීමට අපෝස්තුළුවරුන්ට සිදුවුනේද?**

**ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න අවුල් කිරීමට උත්සහ ගත් අයගෙන් මුල් කිතුනුවන් ආරක්‍ෂා කිරීමට අපෝස්තුළුවරුන් ගත් පියවර ශුද්ධ බයිබලයේ සඳහන් වී ඇත.**

උදාහරණ :-

i **".... ඔබ අතර බොරු ගුරුවරුන් පහළ වනු ඇත. ඔව්හු විනාශකාරී අසත්‍ය ධර්ම උපදවමින්, තමන් මිදූ සමිඳාණන් වහන්සේ ප්‍රතික්ෂේප කරමින්, තමන් පිට හදිසි විනාශය පමුණුවාගන්නෝය...." (2 පේදුරු 2:1-22).**

ii. **"ඔබ වෙත පැමිණෙන යමෙක් මේ ධර්මය රැගෙන නොඑන්නේ නම්, ඔහු ගෙදරට නොපිළිගන්න......" (2 ජොහන් 10).**

iii. **"..... වෙන සුබ අස්නක් නම් නැත. එහෙත් මා එසේ කියන්නේ ඔබ කළඹා ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න අවුල් කරන ඇතැමුන් සිටින නිසා ය. කිසිවෙක් අප දේශනා කළ සුබ අස්නට පටහැනි සුබ අස්නක් දේශනා කළේ නම් ඔහුට සාප වේ වා. (ගලාති 1:7-9)**

**14. වර්තමාන ලෝකයේ කිතුනු සභාවන් සහ මුලධර්මවාදි කණ්ඩායම් රැසක් ඇත්තේ කෙසේද? බෙදීම ඇති වුයේ කුමන හේතුන් නිසාද?**

**නොයෙකුත් කාලවලදි විවිධ හේතූන් මත බෙදීම් ඇතිවිය. ඉන් සමහරක් මෙසේය**

i. ධර්මය පිළිබඳ ඇතිවූ භේද (උදා:- පස්වන සියවසේ ඇරඹුණු නෙස්තෝරියාන සභාව)

ii. සංස්කෘතික අසමතා හේතුවෙන් ඇතිවූ සභා බෙදීම් (උදා:- භාෂා සාහිත්‍යය සහ සිරිත් විරිත් භේද හේතුවෙන් රෝමයත් (ලතින් භාෂාව) කොන්ස්තන්තිනෝපලයත් (ග්‍රීක භාෂාව) මුල්කොට ඇතිවූ අසමගිය උග්‍රවී වර්ෂ 1054 දී සභා දෙකක් වශයෙන් බෙදී ගියේය. "ඕර්තඩොක්ස් සභා" යනුවෙන් හැඳින්වෙන මෙම සභාවන් හා කතෝලික සභාව අතර ධර්මය පිළිබඳව වැඩි වෙනසක් ඇතිවී නැත.)

iii. කිතු සසුනේ සංශෝධනය පරමාර්ථකොට ගෙන 16 වන සියවසේ ඇරඹුණු සංශෝධන ව්‍යාපාරය. මෙම ව්‍යාපාරයේ ප්‍රධාන පුරෝගාමිකයෙකු - වන්නේ ජර්මනියේ (වර්ෂ 1483- 1546 ) විසූ එවකට කතෝලික තාපසයෙකු වූ මාර්ටින් ලූතර් ය. ඔහු විසින් වර්ෂ 1517 දී ලූතරන් සභාව ආරම්භ කරන ලදී. වර්ෂ 1500- 1800 අතර කාලයේදී අන්තිකිසිකලෙක නොවූ තරමට සභා බෙදීම් යුරෝපීය රටවල බහුල විය.

**ලබන සතියට...**

**වික්ටර් සිල්වා**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 93

## WILL / SHALL / WOULD / SHOULD

### Shall භාවිත වන අවස්ථා

**1.** යමක් “කරන්නම්” කියන අනාගත අදහස ගැන කීමට **Shall** හෝ **Will** භාවිතා වෙනවා. (ස්ථිරත්වයක් නැතිව ලිහිල්ව පැවසීමට)

නිදසුන්:-

★ I shall help you.
(අයි ෂැල් හෙල්ප් යූ)
මම ඔබට උදව් කරන්නම්.

★ I shall come to your place on Sunday.
(අයි ෂැල් කම් ටු යුව(ර්) ප්ලේස් ඔන් සන්ඩේ)
මම ඉරිදා ඔබේ ගෙදර එන්නම්.

★ We shall try to come to your party.
(වී ෂැල් ට්‍රයි ටු කම් ටු යුවර් පා(ර්)ටි)
ඔබේ පාටියට එන්න අපි උත්සාහ කරන්නම්.

**2.** ඒ වගේම, යම් දෙයක් අනාගතයේදී සිදුවන බව දැනුම් දීමේදී අපි **shall** යොදනවා. මේ දැනුම් දීම බොහෝ විට අපට වළක්වන්න බැරි දේ පිළිබඳවයි.

**නිදසුන් :-**

★ I shall be twenty years old next year.
(අයි ෂැල් බී ටුවෙන්ටි ඉයර්ස් ඕල්ඩ් නෙක්ස්ට් ඉය(ර්))
ලබන වසරේ මට අවුරුදු 20 ක් පිරෙනවා.

★ We shall get wet if it rains.
(වී ෂැල් ගෙට් වෙට් ඉන් ඉට් රේන්ස්)
වැස්සොත් අපි තෙමෙනවා.

**3.** අපේ කැමැත්තෙන් වෙනස් කරන්න බැරි දේවල් ආශ්‍රිතව ඇතිවෙන අවස්ථාවන් පිලිබඳ කීමේදීත් **Shall** භාවිත වෙනවා.

**නිදසුන්:-**

★ I shall not see you again.
(අයි ෂැල් නොට් සී යූ එගේන්)
මට ආයෙ ඔබව දකින්න ලැබෙන එකක් නෑ කියන අදහස

★ We shall not be happy in our jobs if they do not increase the salary.
(වී ෂැල් නොට් බී හැපි ඉන් අවර් ජොබ්ස් ඉෆ් දේ ඩූ නොට් ඉන්ක්‍රීස් ද සැලරි)
අපිට පඩිය වැඩි නොකළොත් අපිට අපේ රැකියාව ගැන තෘප්තියෙන් වැඩකරන්න බැරිවෙයි කියන අදහස..

**4.** අනාගතයේදී ඇතිවිය හැකි හැඟීම් පිළිබඳව කීමටත් අපට **Shall** භාවිත කළ හැකියි.

★ I shall be happy if you pass the exam.
(අයි ෂැල් බී හැපි ඉෆ් යූ පාස් ද එක්සැම්)
ඔබ විභාගෙ සමත් වුනොත් මට සතුටු හිතේවි).

★ I shall be very upset, if I dont get that job.
(අයි ෂැල් බී වෙරි අප්සෙට් ඉෆ් අයි ඩෝන්ට් ගෙට් දැඩ් ජොබ්)
ඒ රැකියාව නොලැබුනොත් මට “අප්සෙට් වෙයි.”

★ I shall not be surprised if she fails the exam. Because she didn't study.
(අයි ෂැල් නොට් බී ස(ර්)ප්‍රයිස්ඩ් ඉන් ෂී ඩසන්ට් පාස් දි එක්සැම්, බිකෝස් සී ඩිඩ්න්ට් ස්ටඩි) ඇය විභාගෙ අසමත් වුනොත් මං පුදුම වෙන්නෙ නෑ. මොකද ඇය පාඩම් කළේ නැහැ.

**5.** අනාගතයේදී කිරීමට බලාපොරොත්තු වන දේ පිළිබඳව කීමටත් **shall** යෙදිය හැකිය.

★ We shall visit Sigiriya on our way to Polonnaruwa.
(වී ෂැල් විසිට් සීගිරිය ඔන් අවර් වේ ටු පොළොන්නරුව)
පොළොන්නරු යද්දි අපි සීගිරියටත් යනවා.

★ Don't worry we shall win the match.
(ඩෝන්ට් වොරි, වී ෂැල් වින් ද මැච්)
කරදර වෙන්න එපා. අපි මැච් එක දිනනවා.

★ We shall sing and dance at the party.
(වී ෂැල් සින්ග් ඇන්ඩ් ඩාන්ස් ඇට් ද පාර්ටි)
අපි පාටියේදී සින්දු කියනවා. නටනවා.

මේ ඉහත සඳහන් සෑම අවස්ථාවකදීම 1st Person වැකියකදී නම් Will යොදන්නත් පුළුවන්. <u>**Shall** හෝ **Will** අතර වෙනසක් මෙහිදී ඇතිවෙන්නේ නෑ.</u>

### ප්‍රශ්නයක් ඇසීම සඳහා Shall යෙදීම

අපි ඊළඟට Shall කියන වචනය ප්‍රශ්නයක් ඇසීමට යොදාගන්නා හැටි බලමු.

මේ පහත වැකි බලන්න.

★ Shall we go to church? (ෂැල් වී ගෝ ටු චර්ච්?)
අපි පල්ලි යමු ද?

★ Shall we tell him about this? (ෂැල් වී ටෙල් හිම් එබවුට් දිස්)
අපි ඔහුට මේ ගැන කියමු ද?

★ Whall we drink something? I'm thirsty.
(ෂැල් වී ඩ්‍රින්ක් සම්තිං? අයැම් තර්ස්ටි)
අපි මොනවාහරි බොමු ද? මට හරි තිබහයි.

**බලන්න, ඉහත වැකිවල Shall යෙදීමෙන් කෙරෙන්නෙ යෝජනා කිරීමක් + යමක් කිරීම හොඳයි කියන අදහස ප්‍රකාශ කිරීමක් වගේම අනුමැතිය අපේක්ෂා කිරීමක්.**

මේ වැකි දිහා බලන්න.

★ Shall I join you? (ෂැල් අයි ජොයින් යූ?)
මාත් එන්න ද? (මාත් ඔබ කරන දේට සම්බන්ධ වෙන්නද?

★ Shall I open the door? (ෂැල් අයි ඕපන් ද ඩෝ(ර්))
මං දොර අරින්නද?

★ Shall I answer the phone? (ෂැල් අයි ආන්සර් ද ෆෝන්)
මම දුරකථනයට පිළිතුරු දෙන්නද?

# ක්‍රිස්තියානි කලාවේ අගතැන්පත් කලාකරුවෝ

# කතෝලික සංගීතයේ වර්ධනය 13

## පශ්චාත් රෙපරමාදු යුගයේ චිත්‍ර, කැටයම් හා ගොඩනැගිලි.

ත්‍රිදෙන්තීනු සම්මන්ත්‍රණය නිසා නව කලදසාවක් උදාවූයේ සංගීතයට පමණක් නොවේ. චිත්‍ර, කැටයම් හා ගොඩනැගිලි කලාවද එයින් නව පණක් ලබන්නට විය. අලුත් ශෛලි ඒවාට අත්වන්නට විය. එහෙත් කලා අංශවල ඒ පරිවර්තනය එතරම් සන්සුන්ව හටගත් එකක් නොවේ. ත්‍රිදෙන්තීනු සම්මන්ත්‍රණයට ක්‍රියාත්මක වීමට සිදුවූයේ සන්සුන් ස්වභාවික වාතාවරණයක් තුළ නොවේ. කුණාටුවකට අසුවී තිබුණ යුරෝපයක් තුළය. එක පැත්තකින් ග්‍රීක රෝම පුනරුදයෙන්ද තවත් පැත්තකින් ක්‍රිස්තියානි සමාජය දෙකඩ කළ රෙපරමාදු විප්ලවයෙන්ද රෝමය දෙදරුම් කා තිබුණේය. ක්‍රිස්තියානි කලාව ඒ දෙකට මැදිවී සිටියේ ගිරයකට අසුවූ පුවක් ගෙඩියක් සේය.

ශත වර්ෂ ගණනාවක් තුළ සැලකිල්ලට නොගෙන තිබුණ පූර්ව ක්‍රිස්තියානි රෝමානු කලා ශිල්ප, ග්‍රීක - රෝම පුනරුදය නිසා දැන් සැලකිල්ලට ගත යුතු වූයේය. අනිත් පැත්තෙන් ලූතර්වාදි ක්‍රිස්තු බැතිමතුන් විසින් කලාවට එරෙහිව කෙරුණු ගැරහිල්ලද සැලකිල්ලට ගත යුතු වූයේය. මැදි පිළිවෙතක් වෙත කලා ශිල්පීන්ගේ අවධානය යොමු කිරීම හැර වෙනත් දෙයක් ත්‍රිදෙන්තීනු සම්මන්ත්‍රණයට කළ නොහැකි විය.

ගත යුතුවූ ක්‍රියාමාර්ගය සම්මන්ත්‍රණට සම්බන්ධ සභික යෝ පැහැදිලිව විස්තර කළේ නැත. කලා ශිල්ප ගැන අවශ්‍යතරම් අවබෝධයක් ඔවුන්ගෙන් වැඩි දෙනෙකුට තිබුනේ නැත. එම නිසා මොවුහු ගතයුතු පියවර ගැන ඉතාමත් පුළුල් උප දෙසක් දී එයින් නැවතුණෝය.

කාමුක හැඟීම් දනවන කලා රටා පිටුදැකිය යුතුය. සාන්තුවරයන්ගේ රූප නුසුදුසු ආකාරයකින් දැක්විය නොයුතුය. සැරසිය නොයුතුය. ඔවුන් කීවේ එපමණකි. වෙනත් විධියකින් කියතොත් සම්මන්ත්‍රණයෙන් ප්‍රකාශ වුනේ පුනරුදයෙන් පණ ගැන්වූනු පැරණි කලා ශිල්ප ක්‍රිස්තියානි ශීලධර්මවලට පටහැනි නොවන විලාශයකට හැඩැ ගැසිය යුතුය කියා ය.

සභාවේ මෙම උපදෙස සභාවේම ඇතැම් නායක යෝ තේරුම් ගත්තේ තරමක් පටු විලාශයකට ය. ගත යුතු ක්‍රියාමාර්ගයට ආදර්ශයක් දීම අරමුණින් පාප්තුමා තම පෞද්ගලික දේවස්ථානයේ පූජාසනයට ඉහලින් මයිකල් ආන්ජෙලෝ විසින් අඳිනලද ''අවසාන විනිශ්චය ''නැමති චිත්‍රයේ නිර්වස්ත්‍ර රූපවලට වස්ත්‍ර ඇන්දවීමට තීරණය කළේය. එය තරමක් අශුභවාදී තීරණයක් විය. එහෙත් එය ක්‍රියාත්මක කිරීමට යෑමේදී සිදුවූ එක දෙයක් අතිශයින් ශුභවාදිද විය. චිත්‍රවල නිර්වස්ත්‍ර භාවය ඉවත් කිරීමට පාප්තුමා විසින් යෙදාගනු ලැබුණේ දක්ෂ කලාකරුවකු වූ ග්‍රීක ජාතික දොමෙනිකස් තෙයොටොකොපුලොස් 1541- 1617 ය.



රෝම වැසි යෙක් වී සිටි ඔහු එම චිත්‍ර වෙනස් කරනු වෙනුවට එය සම්පූර්ණයෙන්ම මකා අලුත් චිත්‍රයක් ඇඳීමට යෝජනා කළේය. ඔහුගේ එම යෝජනාව නිසා රෝම කලාකරුවන් අතර මහා කැළඹීමක් ඇතිවිය. ඔහුට ඇති වූ විරෝධය කෙබඳුද කිවහොත් ඔහුට රෝමය අතහැර දමා යන්නට සිදුවිය. පාප්තුමාගේ තීරණය ඉටුකිරීමට වෙනත් කෙනෙකු යොදාගනු ලැබීය.

### පශ්චාත් රෙපරමාදු ශෛලියේ චිත්‍ර

රෝමය හැර දමා ගිය තරුණ ග්‍රීක චිත්‍ර ශිල්පියා ඔහුගේ ජීවිතයේ ඉතිරි කොටස ගතකිරිමට ස්පාඤ්ඤයට ගියේ ය. එතැන ඔහු පශ්චාත් රෙපරමාදු චිත්‍ර කලාවේ විශිෂ්ටතම ශිල්පියා බවට පත්වන්නට විය. ස්පාඤ්ඤ ජාතිකයින්ට ඔහුගේ නම සිහිතබා ගැනීම එතරම් පහසු නොවීය. එම නිසා ''ග්‍රීකයා' යන අර්ථය ඇති ''එල්ග්‍රේකෝ'' යන කෙටි නමින් ඔහු හැඳින්විණි.

ස්පාඤ්ඤ යෝග භාවනා ක්‍රමයේ නිර්මාතෘ වරුන්වූ අවිලාවේ තෙරේසාද කුරුසියේ ජෝන්ද ඒවන විට තවමත් ජීවතුන් අතර වූහ. ඔවුන්ගේ ආභාෂය ඔහුගේ චිත්‍රවලින් ප්‍රකාශ වේ. ඒවාද භාවනා යෝග ක්‍රමයටම අනුකූල ඒවා විය. පුද්ගල ජායාරූප කිහිපයක් හැරුනු විට ඔහුගේ හැම චිත්‍රයක්ම ආගමික ආකල්ප මුල්කරගත් ඒවා විය.

සාන්තුවරයින් ඒවායේ දැක්වුනේ ඇට මස්වලින් යුත් පුද්ගලයින් සේ නොවේ. ගිනි දළු සේ හැඟෙන විලාශයකට ය. අසාමාන්‍ය විලාශයකට උස් වූ ඒ රූප සුරලොව වෙත ඇදී යන්නන්ගේ සේ විය. බරක් හෝ ඝනකමක් ඒවායේ නොවීය. ප්‍රාණයෙන් පිරුණු ඔවුන්ගේ ලොකු ඇස් සදාතන ලොවක් කෙරෙහි එල්ල වී තිබෙන්නා සේය.

**සංස්කාරක පියතුමන් විසිනි**

ඉදිරියට .......

# පුංචි අපේ චිත්‍ර පිටුව



**කේරානි ක්‍රිස්ටිනා ග්‍රේ**
09 ශ්‍රේණිය
ශාන්ත ජෝසප් දහම් පාසල
ගම්පොළ

**ශාවින්දි පෙරේරා**
04 ශ්‍රේණිය
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07



**සදෙව් පියුෂ බෝපෙආරච්චි**
02 ශ්‍රේණිය
සාන්ත ජෝශප් විදුහල
කොළඹ 10





**රවිඳු නිම්ශාන් ෆොන්සේකා**
03 ශ්‍රේණිය
සාන්ත ජෝශප් විදුහල
මීගමුව ශාඛාව

**ට්‍රෙවෝන් ශෙනන් රිංස්ලි**
06 ශ්‍රේණිය
ශු. පාවුළු
දේවස්ථානය
නෙළුම්පිටිය
(දළුපත මීසම)




**නෙතාරා ප්‍රනාන්දු**
03 ශ්‍රේණිය
ශු. පවුලේ
කන්‍යාරාමය
බම්බලපිටිය



# ශු. මේරි යුප්‍රේසියා තුමිය (1796 - 1868)



1796 ජුලි 31 වන දින ප්‍රංශයේ නුආමුටියර් යන දූපතේ රෝස් වර්ජිනි ළදැරිය උපත ලැබුවාය. එම උපත ප්‍රංශ විප්ලවය අවසානයේදී සිදුවිය. ඇගේ පියා වෛද්‍යවරයෙකි. දේව ප්‍රේමයෙන් යුත් භක්තිමත් දෙමව්පියන් සෙවනේ ම ඇති දැඩි ව භක්තිමත් චරිතයක් ඇතිව රෝස් වර්ජිනි වැඩුනාය. මේ අතර ඇය දරුණු දුකකට පත්වූයේ ඇය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට පෙර පියා දෙව් සමිඳුන් තුරුලට යාම නිසාය. ඇගේ මව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ඇයව හොඳකාරව සූදානම් කළාය. පාසල් වියටපත් ඇය අධ්‍යාපනය සඳහා ඇගේ මව විසින් ටූර් නගරයේ යහපත් ගුරුවරියන් යටතේ නේවාසික පාසලකට ඇතුලත් කරන ලදී. ඉන්පසු ඇයට ජීවිතයේ තවත් අධික දුකක් ගෙන දෙන සිද්ධියකට මුහුණ දීමට සිදු විය. එනම් ඇගේ මවගේ මරණයයි. මවගේ මෘත ශරීරය පවා ඇයට දැක ගන්නට නොහැකි විය.

රෝස් වර්ජිනී නේවාසිකාගාරය අසල පිහිටි දයාවේ අප ස්වාමිඳුවගේ සොහොයුරියන්ගේ කන්‍යාරාමය බැහැදැකීම පිණිස දිනක් තම මිතුරිය වූ පොලින් ගුරුතුමිය සමග එහි ගියාය. එම කන්‍යා සොහොයුරියෝ වරදට පෙළඹුනු, නොමග ගිය තරුණියන් හා ස්ත්‍රීන්ට නිසිමග පෙන්වීමේ භාරදූර වගකීම භාරගෙන එය ඉටු කරන කන්‍යා සොහොයුරියන් වූහ. එම තරුණියන් දුටු ඇයට ශුද්ධාත්මාලෝකය ලැබ ඇගේ ඉතිරි ජීවිත කාලය දෙවි පියාණන්ට සේවය කිරීමට කැපවීම සඳහා මෙවැනි සේවයකට උන්වහන්සේ කැඳවන බව හැඟී ගියේය. පසුව ඇය 1814 ඔක්තෝම්බර් 20 වන දින මහත් බාධක ජයගෙන එම කන්‍යාරාමයට ඇතුළු වූවාය. 1815 සැප්තැම්බර් 08 වන දින ඇය නව තාපසිකාවක් ලෙස මේරි යුප්‍රේසියා යැයි නම් තැබුවාය. විශ්වාසවන්ත නව තාපස කාලයකට පසු 1817 සැප්තැම්බර් 09 වන දින ප්‍රථම වේදබාර ගිවිස ගත්තාය.

මේරි යුප්‍රේසියා සොහොයුරියට මෙම දැරියන් පසුතැවිලි වී දෙවිඳුන් වෙත හැරවීම සඳහා ඔවුන්ගේ හෘදයන්ට ඉතා සමීප සබඳතාවක් තිබිණි. ඔවුන්ගේ සිත් හැරීම කොතෙක්ද යත් මේරි යුප්‍රේසියා සොහොයුරියන්ගේ තාපස ජීවිතයට ඇතුළු වීමට ඔවුහු අවසර ඉල්ලා සිටියෝය. ඇයට ඔවුන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට කිසි බලයක් නොමැති විය. නමුත් 1825 මැයි 2 වන දින ඇයව ශ්‍රේෂ්ඨ ධුරයට පත් කළ විට ප්‍රථමයෙන් ඇගේ කාර්යය වූයේ එම දැරියන්ගේ ඉල්ලීම ඉටු කිරීමය. ''මග්දලේනා සොහොයුරියෝ '' යන නමින් ඔවුන් නම් කෙරිණි ඒ පන්තිය අද දක්වාම ලොව පුරා පැතිර සිටින භාවනාශීලි තාපසිකා පන්තියකි. අද ඔවුන් හඳුන්වනු ලබන්නේ ''යහපත් එඬේරාණන්ගේ භාවනා ශිලි තාපසිකාවන්'' යනුවෙනි.

මේ කාලයේ පටන් ප්‍රංශයේ ස්ථාන කිහිපයකද අනෙක් මහාද්වීපවලද කන්‍යාරාම පිහිටුවීමට රදගුරුවරුන්ගේ ආරාධනා ලැබ එය ඉටු කළාය. මේ කාලය වන විට දයාවේ අප ස්වාමිඳුවගේ තාපස පන්තිය වෙනුවෙන් ''යහපත් එඬේරාගේ තාපස පන්තිය'' යනුවෙන් නම් කෙරිණි. ඇගේ එකම ආශාව වූයේ ලොව පුරාම තැන තැන තාපසාරාම පිහිටුවීමය. ඒ සඳහා ආධාරකයක් වශයෙන් එතුමියට බොහෝ රදගුරු වසම් වල රදගුරු ආරාමයන් පිහිටුවීමට ආරාධනා කළෝය. ඇගේ මරණ මොහොත වන විට ආරාමයන් 110 ක් විය. ඇගේ මරණයට පෙර ශ්‍රී ලංකාවේ ද ආරාමයක් පිහිටුවීමට ස්ථිර කරන ලදී. එය කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමයයි. 1869 එය ආරම්භ කරන ලදී.

මෙලෙස ශු. මේරි යුප්‍රේසියා මව්තුමිය ආත්මයන් දෙවියන් වහන්සේට දිනා දීම සඳහා තම සේවය නොකඩවා 1868 දක්වා කරගෙන ගියාය. එම වසරේ ඇගේ වයස අවුරුදු 72 කි. මේ වන විට ඇය බරපතළ ලෙස රෝගාතුර වූවාය. ඒ අවස්ථාවේදී පවා ඇගේ වේදනාවන් දරාගෙන සිනා මුසු මුහුණින් සියල්ල විඳ දරා ගත්තාය. ඇයට සාත්තු කළ සියල්ලන්ට ස්තුති වන්න වීමට ඇය අමතක නොකළාය. අප්‍රේල් මාසයේ දිනකදී ඇය මරණාසන්නව සිටින බව දැනී සොහොයුරියන්ට කථා කර මෙසේ කීවාය. ''මගේ දරුවෙනී මම නුඹලාට ආයුබෝවන් කීමට ඉතා කිට්ටුය. මා ආදරණීය යහපත් එඬේරාණෝ නව කුඹුරකට මා කැඳවන සේක '' එදින බොහෝ රටවල සොහොයුරියෝ එතුමියගේ ඇඳ වටා රැස්වී සිටියදී ඇගේ වෙව්ලමින් තිබූ අත ඔසවා සිය අන්තිම ආශීර්වාදය ඔවුනට දුන්නාය.

''මට අයහපතක් කර මා දුක්කළ සියලු දෙනාට මාගේ මුළු හෘදයෙන්ම සමාව දෙමි'' යි කීවාය. ඉන්පසු ඇගේ ඇස් බැබළිණි. අන් අයට නොපෙනෙන දෙයක් දෙසට නැගිට යන්නට ඇය උත්සහයක් ගත් බව සියල්ලන්ට පෙනිනි. ඉන්පසු ඉතා ප්‍රීතියෙන් ඇය මෙසේ කීවාය. ''අහෝ මෝක්ෂය කොතරම් අලංකාරද අන්න ස්වාමින් වහන්සේ ශුද්ධවන්තයන් මැද සිටින බවත් දේව මෑණියන් මා ලඟ වැඩ සිටින බවත් හැඟේ. මාගේ හතරවන දේවභාරය වන ආත්මය දිනා දීමට කළ භාරය නිසා දෙවියන් වහන්සේ මට අනුකම්පා කරන බව හැඟේ. ඉන්පසු ඇය කොට්ටයට හේත්තු වී ශු. සභාවේ විශ්වාසවන්ත දරුවකු ලෙස ඇගේ ප්‍රාණය දෙවිපියාණන්ට පුද කළාය

**අසේල දසනායක**



# ප්‍රහේලිකා අංක 37

හරහට

1. යහපත් සමරිතානු වරයාගේ උපමාවේ සොරුනට අසුවූ මිනිසා ගමන් කරමින් සිටියේ මෙම නගරයටය.

4. යහපත් සමරිතානු වරයා සොරුනට අසුවූ මිනිසා ලඟට ගොස් තෙල් සහ මිදියුෂ ගල්වා ........බැඳ තමාගේ මෘගයා පිට හිඳුවා තානායමට ගෙන ගොස් ඔහු බලා ගත්තේය. මෙහි හිස්තැනට සුදුසු වචනය .

5. තමාට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙපමණක් දක්වා පමණදැයි පේදුරුතුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසුවේය.

7. ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයෝ උපවාස නොකරන්නේ මන්දැයි ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසූ අවස්ථාවේදී ''.......... තමන් සමග සිටියදී ඔහුගේ ඥාති මිත්‍රාදින්ට ශෝක විය හැකිදැයි'' උන්වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

10. ලාසරස්තුමාගේ එක් සහෝදරියකගේ නම

පහළට

1. ක්‍රිස්තුන් වහන්සේ රාජ තේජසින් මෙම නගරයට වඩිනා විට ''සමිඳුන් නමින් වඩිනා රජුට ආසිරි වේවා'' යි කියමින් මිනිසුන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළෝය

2. ස්නාවක ජුවාම් තුමා මිනිසුන්ව බව්තීස්ම ස්නාපනය කළේ මේවායින් බවත්, ක්‍රිස්තුන් වහන්සේ පැමිණි පසු ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද මිනිසුන්ව බෞතීස්ම ස්නාපනය කරන බවත් ජුවාම් තුමා ප්‍රකාශ කළේය.

3. කුරුසිය දරාගෙන මා අනුව නොඑන තැනැත්තාට මාගේ ......... විය නොහැකිය'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

6. අංශබාග රෝගියාව සුවකර ගැනීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ ඉදිරියට පැමිණෙව්වේ මෙට්ටයක තබා නිවසේ මෙය තුළින් පහළට බැස්ස වීමෙනි.

8. ගෝලයන් සැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය අවසානයේදී ක්‍රිස්තුන් වහන්සේ වෙතට හැරී ආ විට ඔබගේ ......... ස්වර්ගයෙහි ලියා ඇති නිසා සංතෝෂ වන්නැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

9. ක්‍රිස්තුන් වහන්සේ තම දුක් ප්‍රාප්තියට පෙර ගෝලයන්ට කථා කරමින් ''මම ඔබහට සැබැව පවසමි. මාගේ නික්ම ...... ඔබගේ ශුභ සිද්ධිය පිණිසය'' යි කී සේක. හිස්තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 3,5,10,11,14,19 පරිච්ඡේද , ශු. මතෙව් 9, 18 පරිච්ඡේද ශු. ජුවාම් 16)**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

**← නිවැරදිව ප්‍රහේලිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේලිකා අංක 37, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

# කළුතර දිසා සිසු නායක නායිකාවන්ට අද මාධ්‍යයේ අභියෝග ගැන වැඩමුළුවක්

කළුතර දිසාවට අයත් මීසම් හි දහම් පාසල් සිසු නායක නායිකාවන් සඳහා විශේෂ වැඩමුළුවක් පසු ගියද කළුතර ජුබිලි ශාලාවේදී පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහාය සංස්කාරක දේශක කුමර නයනජිත් මහතාය. ''යොවුන් වියට අභියෝගයක් වූ අද මාධ්‍යය'' යන තේමාව යටතේ පැවති මෙයට සිසු නායක නායිකාවෝ 110 ක් සහභාගි වූහ.

මෙයට එක්වූ ළමුන්ට දේශනයෙන් පසු ප්‍රායෝගික අභ්‍යාසයක්ද ලබා දුනි. කළුතර දිසා ධර්මෝපදේශ අධ්‍යක්‍ෂ ගරු ඉෂාන් ප්‍රමීන පියතුමාගේ අදහසකට අනුව දිසාවේ දහම් ගුරුභවතුන්ගේ සහයෙන් මෙය සංවිධානය කෙරිනි. **රංජිත් නෝනිස්**

**ඔබේ දහම් පාසල ගැන අපිට ලියලා එවන්න ...**

**ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්ය මණ්ඩලය හා සිසු නායකයින්ගේද සේයාරූ සමඟ අප වෙත යොමු කරන්න. අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**



**ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ**
**කතාව**

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම — ආමල් ද සිල්වා

**22**







